## බඹරගල රජ මහා විහාරය - මැදමහනුවර



තෙල්දෙණිය වැවේගම ගම් පියසට ඇතුළුවෙත්ම ඉතා සුවිශාල ගල් ශිඛරයකින් යුක්ත බඹරගල රජ මහා විහාරය හමුවේ. මෙම ගල් ශිඛරය බඹර වදයක හැඩය ගන්නා නිසා බඹරගල යැයි නම් ලද බව සඳහන් වේ. සම්බුද්ධ මන්දිරය සහිත ගල් ලෙනෙහි වහලය සදිව්‍ය ලෝක ආදී මනරම් සිතුවම් වලින්ද විහාර මන්දිරය තුළ මංගල සුවිසි විවරණය, නාරිලතා මල, ජාතක කථා නිරූපිත ඉපැරණි සිතුවම් රාශියකින්ද කුඩා මකර තොරණකින්ද සමන්විතය. දැනට බඹරගල ශිඛරය පුරා කටාරම් කෙටූ ගල් ලෙන් 59 ක් හමු වී ඇත.

## ගඩලාදෙණිය රජ මහා විහාරය - උඩුනුවර



දවුලගල පිහිටි මෙම විහාරස්ථානය හතරවන බුවනෙකබාහු රජුගේ අනුග්‍රහයෙන් 1347 දී කරවන ලද්දකි. මෙය හින්දු දේවාලයක් මෙන් සම්පූර්ණයෙන්ම කලු ගලින්ම නිමවා ඇත. මෙහි ප්‍රධාන විහාරය බෞද්ධ පූජා විධි සඳහා වෙන්කර ඇති අතර ප්‍රධාන මණ්ඩපයෙන් නෙරා සිටින පරිදි අන්තරාලයෙහි යුත් දේවාලය කුඩාවට සාදා ඇත. එය දෙවියන්ට පූජා පැවැත්වීම සඳහා කරවන ලද්දක් බව සෙල්ලිපියෙහි සඳහන්ව ඇත.


සංචාරක ආකර්ශන ස්ථානයන් සම්බන්ධව
කඳුරට ගුවන් විදුලි සේවයේ 107.5, 90.1, 107.3
ඔස්සේ දිනපතා
පෙ.ව. 6.40 ට විකාශය වන
"හොඳුටු මංපෙත්"
වැඩසටහනට සවන් දෙන්න.


## ලංකාතිලක රජමහා විහාරය - උඩුනුවර



දවුලගල රමණීය පරිසර වටපිටාවක පිහිටා ඇති මෙය ක්‍රි.ව. 1344 දී ගම්පල හෙවත් ගඟසිරිපුර හතරවන බුවනෙකබාහු රජුගේ සමයේ ඉදිවූවකි. ලංකාතිලක විහාරය පොළොන්නරුවේ පැවති ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමය ආශ්‍රිත හින්දු ආභාෂය මෙන්ම දේශීය සම්ප්‍රදාය ද මුසු කොට නිර්මාණට කොට ඇත. පුරා විද්‍යාත්මක වටිනාකමින් අනූන වූ සිංහල හා ද්‍රවිඩ බසින් නිමවූ සෙල්ලිපි දෙකක් මෙම විහාර භූමියේ දක්නට ඇත.

## ඇම්බැක්ක දේවාලය - උඩුනුවර





පිළිමතලාව දවුලගල පිහිටි මෙය 1357 - 1374 කාලයේදී තුන්වන වික්‍රමබාහු රජු විසින් කරවන ලද්දකි. මෙම දේවාලය ප්‍රසිද්ධ වන්නේ ලී කැටයම් නිර්මාණ සඳහායි.

## ඇම්බැක්ක ගල් අම්බලම - උඩුනුවර



ගම්පල උඩුනුවර දක්වා වූ පැරණි මාර්ගයට සම්බන්ධව මෙය ස්ථාපනය කර ඇත. එය ඉදිකර ඇත්තේ හතරවන බුවනෙකබාහු රජු විසින් ලංකාතිලකය ගොඩනැගීමෙන් අනතුරුව ගම්පල සිට එන වන්දනාකරුවන්ගේ ගමන් වෙහෙස නිවීම සඳහායි. මෙහි කැටයම් නිර්මාණ ඇම්බැක්ක දේවාලයේ කැටයම් වලට සමාන බවක් දක්වයි.

## රණාවන රජ මහා විහාරය - යටිනුවර



මෙම විහාර භූමිය විශේෂයෙන්ම ස්වභාවිකත්වයට මුල් තැන දෙමින් යටිනුවර ප්‍රදේශයේ ඉතාම අලංකාර පරිසරයක් තුල ඉදිවී ඇති විහාරස්ථානයකි. ඉන්දියාවේ සාංචි ස්තූපයේ ඇති තොරණහි ආකෘතිය ඉදි කර ඇති එකම විහාරස්ථානය වන්නේ මෙයයි. බුද්ධ චරිතයේ විවිධ අවස්ථාවන් හා බුදුන් වහන්සේ අසූ මහා ශ්‍රාවකයින් සමඟ ධර්ම චාරිකාවේ යෙදෙන ආකාරය දැක්වෙන ප්‍රතිමාවන් විහාරයට ඉහළ භූමි කොටසේ ජීවමාන ඇයුරින් තෙලා ඇත.



# වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව

### මධ්‍යම පළාත




වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව
අංක 1054, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන / ෆැක්ස් : 081 - 2387118
ඊමේල් : tradecomtourcpc@gmail.com
වෙබ් අඩවිය : www.tourism.cp.gov.lk

## මහනුවර ශ්‍රී දළඳා මාළිගාව





මහනුවර ඓතිහාසික ශ්‍රී දළඳා මාළිගාව මුල්වරට ගොඩනඟනු ලැබුයේ පළමු වෙනි විමලධර්මසූරිය රජතුමා විසිනි. එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ උඩරටටම ආවේණික වූ ලක්ෂණයන්ගෙන් අනූනය. ශ්‍රී දළඳා මාළිගාව නගරයට නැගෙනහිරින් උඩවත්ත කැලය අසල රජ මාළිගාව ආසන්නයේ ඉදිකර ඇත. දකුණු පසින් කිරි මුහුද හෙවත් මහනුවර වැවය. උතුරු පසින් රජ මාළිගයයි. බස්නාහිරින් නාථ හා පත්තිනි දේවාල පිහිටා ඇත්තේය.

## බහිරව කන්ද - මහනුවර



මහනුවර නගරයට අඩි 650 ක් පමණ උසින් පිහිටා ඇති රමණීය කඳු ගැටය මුදුනේ අඩි 88 ක් උසැති සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ ශ්‍රී දළදා මාළිගයට මුහුණලා පිහිටා ඇත. මෙහි සිට බලන විට හන්තාන කඳු වළල්ලෙන් වට වූ දර්ශනීය මහනුවර නගරයේ අසිරිය විඳගත හැකිය.



## මහනුවර සතර මහා දේවාල









මහනුවර ඇති පැරණිම ගොඩනැගිල්ල ගම්පල අග යුගයේ ඉදි වූ නාථ දේවාලයයි. බුදුදහමේ හා දළඳා මාළිගාවේ ආරක්ෂකයා ලෙස පිළිගැනෙන විෂ්ණු දෙවියන් උදෙසා ඉදි වී ඇති විෂ්ණු දේවාලය පෙර රජවරුන් අභිෂේක කිරීමෙන් පසු නළල් පටය බඳිනු ලැබීමේ චාරිත්‍රය ඉටු කරනු ලැබුයේ මහනුවර ඇති මේ දේවාලය තුළයි. මහනුවර නගර මධ්‍යයේ පිහිටා ඇති කතරගම දේවාලය නරේන්ද්‍රසිංහ රජ දවස ඉදි කරවන ලද්දකි. ශ්‍රී දළඳා මාළිගා චතුරස්‍රයේ පිහිටා ඇති පත්තිනි දේවාලයද නරේන්ද්‍රසිංහ රජ දවද ඉදි කරවන ලද්දකි.

## මහනුවර පුල්ලෙයාර් කෝවිල



පුල්ලෙයාර් හෙවත් ගණදෙවි කෝවිල කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඉදි කරවන ලද්දකි. දිය කපනා දා රාත්‍රී හා දවල් පෙරහැර දා සතර දේවාල පෙරහැර ගණදෙවි කෝවිලේදී පිළිගෙන පෙරහැර චාරිත්‍ර රැසක් ඉටු කරයි.



## බිසෝ උල්පැන් ගේ - මහනුවර







මහනුවර වැව හෙවත් කිරි මුහුදේ දළඳා මැදුර ඉදිරිපිට ඉවුරේ පිහිටි සුදු පැහැති ගොඩනැගිල්ල උල්පැන් ගෙයයි. මෙය උඩරට අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසෝවරුන් ස්නානය සඳහා යොදාගත් බව පැවසේ. දෙමහල් ගොඩනැගිල්ලක් වූ මෙහි තුන් පැත්තක් ජලයෙන් වට වී තිබේ. උඩුමහල දැව සොල්දර තට්ටුවකි. පහත ඇත්තේ වැව් දිය පිරි තටාකයයි.

## රජපිහිල්ල - මහනුවර







මහනුවර, අම්පිටිය ප්‍රදේශයේ පිහිටි මෙය දුනුමඩලාව රක්ෂිතයෙන් උපත ලබා ගලා එන රජපිහිල්ල ඇලෙහි ජලය වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු සිය බිසෝවරුන්ට ස්නානය සඳහා ඉදි කරවූ බව පැවසේ. කඳු බෑවුම සකසා එහි කළුගල් වලින් ඉදිකළ දිය බේසම අඩි 8 ක් උස කළුගල් වැඹක සවිකර තිබේ. එය පෙනුමෙන් චක්‍රාකාරය.

## ගංගාරාම රජ මහා විහාරය - මහනුවර



ක්‍රි.ව. 1747 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් වෙත සන්නසකින් මේ විහාරස්ථානය පූජා කළ බව සඳහන් වේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ බෝධිසත්ත්ව චරිතයේ මෙන්ම බුද්ධ චරිතයේ විවිධ අවස්ථාද ඒ අයුරින්ම නිර්මාණය කර තිබීමයි. තවද වහලයේ සවිකර ඇති සිවිලිම සම්පූර්ණයෙන්ම අලංකාර සිතුවම් රැසකින් විද්‍යාමාන වේ.

## බෝමුරේ ස්මාරකය - මැදමහනුවර









ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්ලා ගන්නා ලද්දේ මැදමහනුවර බෝමුරේ නම් ස්ථානයේදීය. උඩරට අධිපතීන් ඉංග්‍රීසීන්ට පක්ෂ වූ බව අවබෝධ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ආත්මාරක්ෂාව උදෙසා බිසෝවරුන් සමඟ බෝමුරේ උඩුපිටිය ආරච්චිලාගේ නිවසෙහි සැඟවී සිටියදී සතුරු සේනාව විසින් ඔහුට නිර්දය ලෙස වද හිංසාවන්ට ලක් කොට පහර දී අල්ලා ගන්නා ලදී.